www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇෆ්ගනිස්ථානයේ හා ඉරාකයේ විජිතවාදී ආධිපත්‍ය සඳහා එක්සත් ජනපදය පකිස්ථාන මිලිටරි සහය පතයි

## US seeks Pakistani military support for Afghanistan Iraqi occupations

**විලානි පීරිස්**

**2004 මැයි 22**

ඉරාකය හා ඇෆ්ගනිස්ථානය තුල ගැඹුරුවන මඩගොහොරුවක එරුන බුෂ් පාලන තන්ත්‍රය දෙරටෙහිම මිලිටරි හා දේශපාලන සහයෝගය සඳහා පකිස්ථානයට ඉල්ලීම් මාලාවක් ඉදිරිපත් කර ඇත. කෙසේ වුවද ජනාධිපති පර්වේස් මුෂාරෆ් එක්සත් ජනපද ඉල්ලීම් හා එකඟවීමට ගනු ලබන ඕනෑම පියවරක් පකිස්ථානය තුල විරෝධය ඇවිලවී ස්වතන්ත්‍රය මුහුනදෙන දේශපාලන දුෂ්කරතා තව දුරටත් සංකීර්න වීමට පමනක් තුඩුදෙනු ඇත.

දකුනු ආසියාව සඳහා එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම් ක්‍රිස්ටිනා රොකා පසුගිය සතියේ දී පකිස්ථානය සහ කලාපයට කල ඇගේ සංචාරයේ දී මෙම ඉල්ලීම් ඉදිරිපත් කලා ය. එය තෙමසක් තුල ඉස්ලාමාබාදයට කල රොකාගේ දෙවන සංචාරය විය. මාර්තු මාසයේ දී එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොලින් පවෙල් සමග සිදුකල ප්‍රථම සංචාරය සලකුනු කර බුෂ් පරිපාලනය මිලිටරි බලවතා වන මුෂාරෆ් මත කොතෙක් බලාපොරොත්තු රඳවා ඇත්ද.

රොකාගේ න්‍යාය පත්‍රයෙහි පලමු අංගය වූයේ ඇෆ්ගන් පකිස්ථානු දේශසීමාව දිගේ ක්‍රියාත්මක වෙමින් කාබුල්හි එජ රූකඩ ආන්ඩුවට විරුද්ධ කැරලිකරුවන් වැලැක්වීමට තවදුරටත් පකිස්ථාන මිලිටරි ආධාරය ඉල්ලා සිටීම ය. බුෂ් පාලනය ඇෆ්ගනිස්ථානය තුල සිටින එජ සහ අනිකුත් හමුදාවලට දිගින් දිගට ම කෙරෙන පහරදීම පිලිබඳව කනස්සලු වනවා පමනක් නොව ඊනියා ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ ‘‘ජයක්’’ පිලිබඳව නොඉවසිලි සහගතව ඇත. එජ ඔත්තුසේවාවලට අනුව ඔසාමා බින්ලේඩන් සහ ඔහුගේ ලුතිනන් ලෙස හඳුන්වන අයිමාන් අල් ෂවාගිරි නමැත්තා ඇතුලු ඉහලපෙලේ අල්කයිඩා සාමාජිකයන් කඳුකර දේශසීමා ප්‍රදේශවල සැඟවී සිටිති.

වොෂිංටනයේ බලකිරීම මත, පකිස්ථාන මිලිටරිය පෙබරවාරි සහ මාර්තුවල දී 70,000 කට අධික අධිසන්නද්ධ භටයන් සම්බන්ධ වූ දැවැන්ත මෙහෙයුමක් ගෝත්‍රික දේශසීමා ප්‍රදේශවල මෙහෙය වීය. අරමුන වූයේ ‘‘විදේශ’’ හා ‘‘අල් කයිඩා’’ සටන්කරුවන් අල්ලා ගැනීම හෝ මරා දැමීම හෝ දහස්ගනන් එජ භටයන් බලමුලුගන්වා සිටි පකිස්ථානය තුලට දේශසීමා හරහා ඔවුන් පලවාහැරීම ය. ප්‍රාදේශීය ගෝත්‍රික සටන්කරුවන් සමග තියුනු සටනේදී නිල වසයෙන් අඩුතරමින් පකිස්ථාන සොල්දාදුවන් 50ක් ඝාතනය වී හා නිලධාරීන් සහ භටයන් රැසක් සටන් කිරීම ප්‍රතික්ෂේප කල මෙම මෙහෙයුම කෙසේ වෙතත්, ප්‍රධාන අල් කයිඩාවරුන් අල්ලාගත නොහුනු විනාශකාරී එකක් ලෙස ප්‍රත්‍යක්ෂ විය.

සම්ප්‍රදායිකව පකිස්ථාන ආරක්ෂක හමුදාවලට අතපෙවිය නොහැකි වූ මෙම අර්ධ ස්වාධීන ප්‍රදේශවල මෙහෙයුම් තියුනු විරෝධයක් ඇවිලවී ය. නින්දාවෙන් ගැලවීමේ විධික්‍රමයක් ලෙස ඇෆ්ගනිස්ථානය තුල විරෝධතා කටයුතු අවසන් කරන බවට එකඟවනතාක් දුරට ගෝත්‍රික ප්‍රදේශවල සිටීමට අවසර ලැබෙන විදේශිකයන් ලියාපදිංචි කිරීමට අප්‍රේල් 25දා ගෝත්‍රික නායකයන් සමග ගිවිසුමකට මුෂාරෆ් එලඹියේ ය. අද දක්වා කිසිදු විදේශ සටන්කරුවකු ලියාපදිංචි කර නොමැත.

පකිස්ථානයේ සැලසුම් සහ කාබුල් තන්ත්‍රයේ සතුරන් දඩයම් කිරීමට වැඩි යමක් කිරීමට අසමත්වීම පිලිබඳව වොෂිංටනය කනස්සල්ලට පත්ව ඇත. ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද තානාපති සල්මයි කාලිෂාඩ් විසින් “පකිස්ථානය තුල අල්කයිඩා සහ තලෙබාන්වරුන් දිගට ම රැඳී සිටීමට” එරෙහිව කරන ලද ප්‍රකාශයක් සමග රොකාගේ සංචාරය සමපාත වේ. *ඩෝන්* පුවත්පතට අනුව ගෝත්‍රික ප්‍රදේශවල ‘‘විදේශ සටන්කරුවන්ගේ ගැටලුව ගැන වගබලා ගැනීමට උචිත උපායක්’’ ක්‍රියාවට නඟන ලෙස රොකා මුෂාරෆ්ගෙන් ඉල්ලා සිටියා ය.

රොකාගේ සංචාරයට ආසන්නව, පකිස්ථාන හමුදාව නැවතත් දේශසීමා ප්‍රදේශවල සේනාංක යොදවා ඇත. මේ සතියේ *ඒෂියා ටයිම්ස්* පුවත්පතේ ලිපියක් සදහන් කලේ, "පකිස්ථාන සන්නද්ධ හමුදාවේ නව සහායක බල ඇනි වානා (දකුනු වෂිරිස්තාන්), මිරාන්ෂා (උතුරු වෂිරිස්තාන්) සහ වයඹ දේශසීමා ප්‍රදේශයේ බන්නු සහ ඩෙරා ඉස්මයිල්වලට යවා තිබෙන අතර මිලිටරියට

සමීප නිලධාරීන් පවසන්නේ තමන් "මල පුඩුවකට ගමන් කරමින්" සිටින බවට බිය කරන බවයි.

"(කලින්) දකුනු වශිරිස්තාන්වල මෙහෙයුමේ විපතට පත් වූ නිල සංඛ්‍යාව හටයන් 50 ක් වුවත් ප්‍රදේශයේ ග්‍රෝත්‍රිකයන් සඳහන් කරන්නේ - අතිශයෝක්තියට ඉඩදුන්නත් - මෙම සංඛ්‍යාව දසගුනයකටත් වඩා ඉහල බව යි.... පැහැරගනු ලබන පකිස්ථාන නිලධාරීන් පිලිබඳ කථා බහුලව පැවතිය ද ආන්ඩුව තහවුරු කලේ 12 කි. සංඛ්‍යා නිකුත් කලේ සාකච්ඡාවලින් පසුව ය."

ඉරාකය තුල දේශපාලන සහ මිලිටරි තත්වයේ පරිහානියකට මුහුන පා සිටින අතර "ඉරාකයේ ජාත්‍යන්තර ඒකාබද්ධ හමුදාවන්ට පකිස්ථාන හමුදා දායකත්වයක්" සඳහා එක්සත් ජනපද ඉල්ලීම රොකා නැවත ප්‍රානවත් කලා ය. පසුගිය ජූනියේ දී දස දහසක් හටයන් ඉරාකයට පිටත් කිරීමට මුෂාරෆ් "ප්‍රතිපත්තියක් ලෙස" එකඟවුවත් පකිස්ථානය තුල විරෝධය නැගෙත්ම රටේ පාලනය එක්සත් ජාතීන් යටතේ විය යුතු යයි අවධාරනය කරමින් පොරොන්දුව මගහැරියේ ය. අලුත්ම ඉල්ලීම ගැන අදහස් ප්‍රකාශ කරමින් විදේශ කාර්යාල ප්‍රකාශක මසූඩ් කාන් දැන් "ඉරාකයට හමුදා යැවීම සිදු නොවනු ඇතැයි" ප්‍රකාශ කලේ ය.

රොකා, ජූනි 30 දා සිදුවීමට නියමිත ඊනියා ස්වාධිපත්‍ය ඉරාකය වෙත පවරා දීම නීතිගත කිරීමට ඉදිරිපත් කරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩල යෝජනාවට සහයෝගය දෙන්නැයි මුෂාරෆ්ගෙන් ඉල්ලා සිටියා ය. ආරක්ෂක මන්ඩලයේ වර්තමාන ස්ථිර නොවන සාමාජිකයෙකු ලෙස පකිස්ථානයේ ඡන්දය වොෂිංටනයට අවශ්‍ය ය. වඩාත් පුලුල් වසයෙන් බුෂ් පරිපාලනය ඉරාකය තුල එහි නව විජිතවාදී ආක්‍රමනික වැඩ පිලිවෙල සඳහා කිසියම් දේශපාලන සගයෙක්, විශේෂයෙන්ම මුස්ලිම් රටවලින් සොයාගැනීමේ මංමුලාසහගත උත්සාහයක යෙදී සිටී.

දේශපාලන ප්‍රතිරෝධය

කෙසේ වෙතත් "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය" සඳහා මුෂාරෆ්ගේ සහයෝගය පකිස්ථානය තුල දැනටමත් පුලුල් විරෝධයක් අවුලුවා ඇත. 2002 මැතිවරනයේ දී ඇෆ්ගනිස්ථානයේ එක්සත් ජනපද මිලිටරි මැදිහත්වීම හා පසුව ඉරාක ආක්‍රමනය කෙරේ පැවති ක්‍රෝධය ගසා කමින් ඉස්ලාම් මූලධර්මවාදී මුටහිඩා මැජ්ලිස්-ඉ-අමල් (එම්එම්ඒ) සැලකිය යුතු ජයක් ලබා ගත්තේ ය. විශේෂයෙන් ම එම්එම්ඒ දැනට පලාත් සභා දෙකක් පාලනය කරන දේශසීමා ප්‍රදේශවල මෙම සතුරුකම දක්නට ලැබුනි.

ඇයගේ සංචාරයට පෙර පෙන්සිල්වේනියා සරසවියේ දී කල කථාවකදී රොකා, මුෂාරෆ් විසින් ගෙවනු ලබන දේශපාලන මිල ගැන සඳහන් කලා ය. "ත්‍රස්තවාදයට එරෙහි භූගෝලීය යුද්ධයේ දී පකිස්ථානයේ සහයෝගීතාවය වෙනුවෙන් ඉස්ලාමාබාදයටත් රටේ සමාජ වියමනටත් වියදමක් දරන්නට සිදුව තිබේ" යයි ඇය ප්‍රකාශ කලා ය. පිරිහෙන ආර්ථිකයක් සහ වැඩෙන සමාජ ධ්‍රැවාන්තගතවීම් මධ්‍යයේ නායකත්වයෙහි සිටින මුෂාරෆ්ට එක්සත් ජනපදය කිහිපවිටක්ම අල්ලස් පිරිනමා ඇත. පකිස්ථානය සඳහා ඩොලර් බිලියන 3 පස් අවුරුදු ආධාර පැකේජයක ප්‍රථම ඩොලර් මිලියන 660 ජනාධිපති බුෂ් කොංග්‍රසයෙන් ඉල්ලා සිටිනු ඇතැයි රොකා ඇඟවුම් කලා ය. පකිස්ථානය, නේටෝ නොවන ප්‍රධාන සගයෙක් බවට ද පත්කිරීමේ සැලසුම් සහිතව ධවල මන්දිරය ක්‍රියා කරමින් සිටී. එම රටවල් වොෂිංටනයෙන් මිලිටරි ආධාර ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

බුෂ් පාලනය මිලිටරි නායකයාගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවේදයන් පිලිබඳ සියලු විවේචන පසෙක ලා තිබීම, ජෙනරාල් මුෂාරෆ්ගේ දෘෂ්ටි ආස්ථානය ද වැදගත් ය. තේරීපත් වූ අගමැති නවාෂ් ෂරීෆ් ආන්ඩුව 1999 දී හමුදා කුමන්ත්‍රනයකින් නෙරපා හරිමින් බලය ඩැහැගත්තේ ය. ගොතනු ලැබූ චෝදනා මාලාවක් මත ෂෙරීෆ්ට නඩුදමා බන්ධනාගාර ගත කරනු ලැබ අවසානයේදී තම පවුලත් සමඟ හිටපු අගමැතිට පිටුවහල්වීමට අවසර දෙනු ලැබී ය.

පසුගිය වසර පහ මුලුල්ලේ මුෂාරෆ් තම තත්වය තහවුරු කර ගැනීමට ජනාධිපති නිලය තුල අසීමිත බලතල සංකේන්ද්‍රනය කරන්නාවූ ප්‍රජාතන්ත්‍රවාදී නොවන ව්‍යවස්ථාදායක වෙනස්කම් මාලාවක් යොදාගෙන තිබේ. 2002 මැතිවරනය වංචනික එකකැයි පුලුල් වසයෙන් සලකනු ලබයි.

පසුගිය වසරේදී මුෂාරෆ් ජාතික ආරක්ෂක මන්ඩල පනත (එන්එස්සී) පාර්ලිමේන්තුව ලවා සම්මත කර ගත්තේ ය. එන්එස්සී ය ඒකාධිපතිත්වය නීතිගත කිරීම එල්ල කරගත් ආඥාපනත (Legal Framework Ordinance - LFO) හි කොටසකි. පසුගිය අවුරුද්දේ දී තමන් යුද හමුදා නායකත්වයෙන් ඉල්ලා අස්වන බව මුෂාරෆ් එම්එම්ඒ යට පොරොන්දු විය. නමුත් මිලිටරි නායකයන් විසින් පාලිත එන්එස්සී යේ සභාපති ලෙස පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට අවශ්‍ය හැකියාව ද ඇතුලත් සැලකිය යුතු බලයක් පවත්වා ගෙන යාම ඔහු විසින් අඛන්ඩව කරනු ඇත.

වොෂිංටනය ආරම්භයේදී මිලිටරි කුමන්ත්‍රනය ගැන වාචික විවේචන එල්ල කල ද 2001 වසරේදී මුෂාරෆ් තලේබාන් තන්ත්‍රය වෙනුවෙන් මුලින් දැක්වූ සහය ඉවතලා ඇෆ්ගනිස්ථානයේ මෙහෙයුම්වලට ක්‍රියාත්මකව පිටුබලය සැපයීමෙන් පසු ඒවාද නවතා දැමුනි. මුෂාරෆ් තවදුරටත් ශක්තිමත් කිරීමේ පියවරක් ලෙස එජ දැන් පකිස්ථානය ඉවත් කිරීමට ගත් තම 1999 තීරනය වෙනස් කිරීමට බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මංඩලයීය රටවලින් ඉල්ලා සිටියි.

බුෂ් පරිපාලනය පකිස්ථානයේ ප්‍රජාන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කිරීම පිලිබඳව පිලිකුල් සහගත ලෙස ඇස් පියාගෙන සිටියි. අර්ථාන්විතව ම, ධූරයෙන් පහකෙරුන අගමැතිගේ සොහොයුරු වූ ද පකිස්ථාන මුස්ලිම් ලීගයේ (පීඑම්එල්-එන්) සභාපති වූ ද ෂබාස් ෂරීෆ්, පකිස්ථානයට ගොඩ බැස පැයකට දෙකකට

පසුව බුෂ් පරිපාලනය ඔහු රටින් පිටුවහල් කලේ රොකා ඉස්ලාමාබාදයට ලඟා වූ දින ම වීම අර්ථභාරී ය. *ඩෝන්* පුවත්පතට අනුව එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවට මේ බව දැනුම් දී තිබුනු බව පිලිගත්තත්, පිටමං කිරීම “අභ්‍යන්තර කටයුත්තක්” යයි ඒ පිලිබඳව අදහස් දැක්වීම ප්‍රතික්ෂේප කලේ ය.

ෂබාස් වෙනුවෙන් තම සහය පලකිරීමට ලාහෝර් ගුවන් තොටුපලට පැමිනි මුස්ලිම් ලීගයේ සාමාජිකයන්ට පකිස්ථාන ආරක්ෂක හමුදා බැටන් ප්‍රහාර හා කඳුලු ගෑස් ප්‍රහාර එල්ල කලේ ය. දහසකට අධිකව අත් අඩංගුවට ගනු ලැබූහ. "ෂබාස් පිලිබඳව ආන්ඩුවේ ප්‍රතික්‍රියාවෙන් ඇතිකලේ ඔහු ආන්ඩුව පෙරලා දැමිය හැකි භූමිකම්පාවක් සේ එය විසින් සලකා ඇති සැටියකි යි" ද *නේෂන්* පුවත්පතෙහි පලවිය. මුෂාරෆ්ගේ බලාධිකාරය කොතරම් දුර්වලදැයි කියතොත්, ඕනෑම විරෝධයකට ඔහු බියක් දක්වයි.

අප්‍රේල් 22 දා මැක්ඩුම් ජේවිඩ් හස්මී කැරලි ගැසීමේ බොරු චෝදනා මත 23 අවුරුදු සිරදඬුවමකට සහ රුපියල් 42000 යටත් කොට වැරදිකරු කරනු ලැබුවේ ය. හෂ්මි, ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා වු සන්ධානය (ඒආර්ඩී) නමින් වූ පක්ෂ 15 විරුද්ධ සභාගයේ ප්‍රමුඛත්වය දරන තවත් පීඑම්එල්-එන් නායකයෙකි. තමාම පනවාගත් පිටුවහලක සිටින, තවත් හිටපු අගමැති කෙනෙකු වූ බෙනාසීර් භූතෝගේ පකිස්ථාන ජනතා පක්ෂය ද (පීපීපී) සංධානයට ඇතුලත් ය.

මුෂාරෆ් පිලිබඳව මෙන්ම වොෂිංටනය සමග ඇති ඔහුගේ මිත්‍රත්වය ගැන විවේචනය කරමින් හමුදා නිලධාරියෙකු විසින් නිලමුද්‍රා සහිත කොලයක ලියන ලද ලිපියක් පිලිබඳව හෂ්මිට චෝදනා නගන ලදි. ලිපිය ව්‍යාජ එකක් බවටත් හෂ්මිට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවටත් ආන්ඩුව ක්ෂනිකවම ප්‍රකාශ කලේ ය. නඩු විභාගය අද්‍යාල බන්ධනාගාරයේ දී පැවැත්වූ අතර දඬුවමම ආවෘත සැසියක් මගින් ප්‍රකාශයට පත් කලේ මාධ්‍ය වාරනයක් ද සහිතව ය. පීඑම්එල්-එන් ප්‍රකාශක සිද්දික් පාරුක් තීන්දුව හෙලා දැක්කේ "නීතිය මුෂාරෆ් මිට මොලවාගෙන ඇතැයි" පවසමිනි.

යුරෝපා සංගමය හස්මි නිදහස් කල යුතු යයි ඉල්ලා සිටි අතර වොෂිංටනය නඩුව නිසියාකාරව අසන්නට ඇතැයි ප්‍රකාශ කරමින් ඔහුගේ සිරදඬුවමම නොතකා හැරියේ ය. එය හරියටම සිදුවූයේ  බුෂ් පරිපාලනය දෛනික පදනමක ඉරාකයේ සහ ඇෆ්ගනිස්ථානයේ මෙන්ම එක්සත් ජනපදය තුලමත් මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පාගා දමන්නාක් මෙන් ය. එජ ආර්ථික හා මුලෝපායික අවශ්‍යතාවලට අබන්ඩව සහාය දෙන තාක් කල් පකිස්ථානයේ මිලිටරි නායකයෙකුට මුක්කු ගැසීමේ ලා එජ ට කිසිදු පැකිලීමක් නැත.

© www.wsws.org